# ශ්‍රී ලංකා ටෙලිකොම් හි
# රැකියා අවස්ථා



ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම් සමූහය යනු, 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 91ක වාර්ෂික පිරිවැටුමක් සහ 10,000කට වැඩි සේවක පදනමක් සහිත මෙරට ප්‍රමුඛතම පිළිගත් සමාගමකි. එය මවු සමාගමකින් සහ මොබයිල් සේවා පහසුකම් සපයන මොබිටෙල් සමාගම ඇතුළු උප සමාගම් දහයකින් සමන්විතය. සැලසුම්ගත ව්‍යාපාර පුළුල් කිරීමට සමගාමීව අනාගත මානව සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට සහ එස් එල් ටී සමාගම් සමූහය ඩිජිටල්කරණයට අනුවර්තනය වීමේ ගමන ශක්තිමත් කිරීමට දායකත්වය සැපයිය හැකි ප්‍රතිඵලදායී ඉහළ හැකියාවකින් යුක්ත, මනා පළපුරුද්දක් සහිත අයැදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් හි පහත රැකියා අවස්ථා විවෘතව පවතී.

## කාර්මික ශිල්පීන් (පිරිමි)

විදුලි සංදේශ ජාලයන් හි ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපකරණ ස්ථාපනය කිරීම, නඩත්තුව සහ අලුත්වැඩියා කිරීමත්, දෝෂ සොයාගැනීම සහ අලුත්වැඩියා කිරීම පිණිස විදුලි සංදේශ උපකරණ සහ පද්ධති පරීක්ෂා කිරීමත්, කාර්මික ශිල්පීන්ගේ ප්‍රධාන වගකීම වේ.

**අධ්‍යාපන සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම්:**

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකම වරක දී සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් සම්මාන සාමාර්ථ තුනක් (03ක්) සහිතව සමත්ව තිබීම,
සහ

ii. NVQ - 4 මට්ටමට සමානව (විදුලි සංදේශ/විදුලි /තොරතුරු තාක්ෂණ/බල/වායු සමීකරණ ආදී) අදාළ ක්ෂේත්‍රවල ජාතික ආධුනිකත්ව සහ වෘත්තීය පුහුණු අධිකාරියේ (NAITA) නිපුණතා සහතිකය ලබාසිටීම
හෝ

iii. ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ඉංජිනේරු කාර්මික ශිල්පියෙක් වශයෙන් ලියාපදිංචි වී සිටීම
සහ

iv අවම වශයෙන් 'B' වාහන පන්තියේ මෝටර් රථ පැදවීම සඳහා වලංගු රියැදුරු බලපත්‍රය

**අනෙකුත් කොන්දේසි:**

- අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොවැඩි පිරිමි අයදුම්කරුවන් විය යුතුය.
- එක් අවුරුදු පරිවාස කාලසීමාවකට යටත්ව ස්ථිර පදනම මත පත්වීම් දෙනු ලැබේ.
- සාර්ථක අයැදුම්කරුවන්ට ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට සමාන තරඟකාරී වේතන පැකේජයක් සහ අමතර ප්‍රතිලාභ හිමි වේ.
- තෘප්තිමත් වෘත්තීයමය උසස්වීම් අවස්ථා
- එස් එල් ටී මානව සම්පත් කොට්ඨාසය විසින් කෙටි ලේඛනගත කරන ලද අයැදුම්කරුවන් පමණක් කැඳවනු ඇත.
- කොළඹ සහ පිට ප්‍රදේශවල පුරප්පාඩු පවතී.

**අයැදුම් කිරීමේ ක්‍රමය:**

www.sltmobitel.lk වෙබ් අඩවිය (careers page) වෙත පිවිස, අයැදුම්පත් (CV) ඔන්-ලයින් මඟින් ඉදිරිපත් කළ යුතුය. මෙම දැන්වීම පළ වී දින 10ක් ඇතුළත ඔබගේ ඔන්-ලයින් අයැදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික හා අනෙකුත් අදාළ සහතිකවල ස්කෑන් පිටපත් සමඟ මෑතක දී ගත් ඔබගේ ඡායාරූපයක් ද ඇතුළත්ව ඔන්-ලයින් මඟින් ඉදිරිපත් (submit) කරන්න.

සහතික පිටපත් (සහාය ලේඛන) රහිත අයැදුම්පත් සහ තැපැල් මඟින් එවනු ලබන අයැදුම්පත් භාරගනු නොලැබේ.

www.sltmobitel.lk වෙබ් අඩවියේ (careers page) වෙතින් අයැදුම්පත් ලබාගත හැකි අතර ඇමුණුම් ගොනු (Attachment file) ප්‍රමාණය මෙගා බයිට්ස් 15 (15MB) නොඉක්මවිය යුතුය.

ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී සමාන අවස්ථා සේවායෝජකයෙක් වන බැවින් කුමන ආකාරයේ හෝ බලපෑමක්/සහාය පැතීමක් නුසුදුසුකමක් සේ සැලකේ.

**ප්‍රධාන පිරිස් නිලධාරී**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

SLTMOBITEL
එකම එක සබැඳියාව

www.sltmobitel.lk